සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	10 ශ්‍රේණිය	කෘෂි හා ආහාර තාක්ෂණය I -II	කාලය / நேரம் / Time	පැය 03යි

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

අතිරේක කියවීම් කාලය : මිනිත්තු 10 **අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

නම-:..... **විභාග අංකය-:.....**

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුල (×) ලකුණ යොදන්න.**




1 පත්‍රය

01. "අහසින් වැටෙන එක දිය බිඳුවක් හෝ මිනිසාගේ ප්‍රයෝජනයට නොගෙන මහ මුහුදට ගලා යාමට ඉඩ නොතැබිය යුතුය" මෙම කියමන ප්‍රකාශ කරනු ලැබුවේ,
1. මහසෙන් රජුය. 2. පරාක්‍රමබාහු රජුය.
3. වසභ රජුය. 4. ධාතුසේන රජුය.

02. ප්‍රධාන දේශගුණික කලාපයක් වන තෙත් කලාපයේ වාර්ෂික වර්ෂාපතනය,
1.500mmට අඩුය. 2. 1750mmට අඩුය. 3. 2500mmට වැඩිය. 4.1750-2500mm

03. උෂ්ණත්වය, සුළඟේ වේගය, සාපේක්ෂ ආර්ද්‍රතාවය හා ආලෝක තීව්‍රතාවය මනින උපකරණ නිවැරදි අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර වනුයේ,
1. තෙත් වියලි බල්බ උෂ්ණත්වමානය, අනිලමානය, ආර්ද්‍රතාමානය, සූර්ය විකිරණමානය.
2. උපරිම අවම උෂ්ණත්වමානය, අනිලමානය, තෙත් වියලි බල්බ උෂ්ණත්වමානය, සූර්ය විකිරණමානය.
3. තෙත් වියලි බල්බ උෂ්ණත්වමානය, අනිලමානය, ආර්ද්‍රතාමානය, සූර්ය දීප්තමානය.
4. උපරිම අවම උෂ්ණත්වමානය, අනිලමානය, තෙත් වියලි බල්බ උෂ්ණත්වමානය, සූර්ය දීප්තමානය.

04. විවිධ සාධකවල බලපෑම නිසා මාතෘ පාෂාණය ජීර්ණය වී මාතෘ ද්‍රව්‍ය සෑදෙයි. මෙම මාතෘ ද්‍රව්‍ය පාංශු පැතිකඩෙහි කුමන කලාපයේ (ස්ථරයේ) දක්නට ලැබේ ද?
1. A කලාපයේ 2. B කලාපයේ 3. C කලාපයේ 4. R කලාපයේ

05. සිසුන් පිරිසක් විසින් පස් වර්ග කිහිපයක් පිළිබඳ කරන ලද පරීක්ෂණයක ඇටවුමක් පහත රූප සටහනේ දැක්වේ. මෙහිදී සෑම පුනීලයකටම සමාන ප්‍රමාණ වලින් වියලන ලද විවිධ පස් වර්ග හතරක් යොදා ඒවාට සමාන ජල පරිමාද එකතු කරන ලදී. ලද නිරීක්ෂණ වලට අනුව එම පස් සාම්පල වලින් වැඩිම වැලි ප්‍රතිශතයක් අඩංගු පස් සාම්පලය ඇත්තේ කුමන ඇටවුමේ ද?
1.  2.  3.  4. 

06. අවුරුද්දේ කුමන කන්නයක වුවද වගා කිරීමට සුදුසු බෝග හඳුන්වනු ලබන්නේ,
1. ප්‍රභා අවධි සංවේදී බෝග 2. උදාසීන බෝග
3. දිගු දින බෝග 4. කෙටි දින බෝග

Past Papers Wiki

07. ශිෂ්‍යයෙක් පෝච්චියක සිටුවන ලද මිරිස් පැළයකට වැඩිපුර ජලය යොදන ලදී. එහි පතුලේ ඇති සිදුරෙන් අතිරික්ත ජලය සියල්ල බැස ගිය පසු පසෙහි අඩංගු ජල ආකාර වනුයේ,
1. කේශාකර්ෂණ ජලය හා ගුරුත්වාකර්ෂණ ජලයයි.
2. ජලාකර්ෂණ ජලය හා ගුරුත්වාකර්ෂණ ජලයයි.
3. ජලාකර්ෂණ ජලය හා කේශාකර්ෂණ ජලයයි.
4. ජලාකර්ෂණ ජලය පමණි.

08. ශ්‍රී ලංකාවේ පාංශු බාදනයට හේතු වන ප්‍රධාන සාධකය වනුයේ,
1. මුහුදු රළය.
2. ගලායන ජලය ය.
3. වේගවත් සුළඟ ය.
4. සත්ත්ව ක්‍රියාකාරකම් ය.

09. සොලනේසියේ, රුටේසියේ, බ්‍රැසිකේසියේ හා ෆැබේසියේ කුලවලට අයත් බෝග පිළිවෙළින් දැක්වෙන්නේ,
1. මිරිස්, දොඩම්, ගෝවා, මෑ
2. තක්කාලි, ගෝවා, දෙහි, මෑ
3. මිරිස්, රාඹු, බඩ ඉරිඟු, දඹුල
4. තක්කාලි, දොඩම්, මෑ, රාඹු

10. පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශ වනුයේ,
A - ශ්‍රී ලංකාව තෙත්, වියලි, අතරමැදි වශයෙන් ප්‍රධාන දේශගුණික කලාප තුනකට බෙදිය හැක.
B - ශ්‍රී ලංකාවට වර්ෂාපතනය මෝසම්, සංවහන හා වාසුළි ලෙස ප්‍රධාන වර්ෂා ආකාර තුනකින් ලැබේ.
C - තෙත් කලාපයට ප්‍රධාන වශයෙන් ඊසාන දිග මෝසමෙන් වර්ෂාව ලැබේ.
1. A හා B පමණි.
2. A හා C පමණි.
3. B හා C පමණි.
4 . A , B හා C සියල්ලමය.

11. මූලික බිම් සැකසීමේ ප්‍රධාන පියවර වනුයේ,
1. ප්‍රාථමික බිම් සැකසීම හා අතුරුයත් ගෑමයි.
2. ද්විතියික බිම් සැකසීම හා අතුරුයත් ගෑමයි.
3. පස පෙරළීම හා බෝග සංස්ථාපනය යි.
4. ප්‍රාථමික බිම් සැකසීම හා ද්විතියික බිම් සැකසීමයි.

12. ආම්ලික පසක් බෝග වගාවට සුදුසු තත්වයට පත් කිරීමට පසට යෙදිය යුතු වන්නේ,
1. කැල්සියම් කාබනේට් ය.
2. කාබනික ද්‍රව්‍ය ය.
3. ජිප්සම් ය.
4. ගෙන්දගම් ය.

13. වැටි හා කාණු පාත්තිවල සිටුවීමට නිර්දේශිත බෝගය වනුයේ,
1. කැරට්
2. රටකජු
3. මිරිස්
4. බණ්ඩක්කා

14. ශිෂ්‍යයෙක් විශාල පස් කුට්ටියක් පවතේ වියලන්නට ඉඩහැර එය මීටර් 1 ½ ක පමණ උසක සිට බිමට වැටෙන්නට සලස්වා කැඩී බිඳී යන පස් කැට්ටි නිරීක්ෂණය කරන ලදී. මෙම පරීක්ෂණය සිදු කරනුයේ,
1. පාංශු වර්ණය සෙවීම සඳහාය.
2. පාංශු වයනය සෙවීම සඳහාය.
3. පාංශු ව්‍යුහ ආකාර සෙවීම සඳහාය.
4. පාංශු තෙතමනය සෙවීම සඳහාය.

15. ද්විතියික බිම් සකස් කිරීමේ අරමුණ වන්නේ,
1. පස පෙරළීම හා කැට පොඩි කිරීම.
2. වල්පැළ පාලනය හා කැටපොඩි කිරීම.
3. පස පෙරළීම හා වල්පැළ පාලනය යි.
4. කැට පොඩි කිරීම හා මට්ටම් කිරීම.

16. මෙම උපකරණය භාවිත කරන්නේ,



1. පසේ pH අගය මැනීම සඳහාය.
2. පාංශු තෙතමන ප්‍රමාණය මැනීම සඳහාය.
3. ආලෝක තීව්‍රතාවය මැනීම සඳහාය.
4. වයුගෝලීය ආර්ද්‍රතාවය මැනීම සඳහාය.

17. පාංශු පෝෂක අතුරින් ක්ෂුද්‍ර පෝෂකයන් වන්නේ,
1. මැග්නීසියම්
2. කැල්සියම්
3. මැංගනීස්
4. සල්පර්

18. නයිට්‍රජන් ඌනතා ලක්ෂණයක් වන්නේ,
1. මේරූ පත්‍ර දම් පැහැ වීම.
2. මේරූ පත්‍ර කහ පාට වීම.
3. මල් සහ ඵල විකෘති වීම.
4. පත්‍ර දාර කහපාට වීම.

19. වියලි කලාපීය ප්‍රදේශ සඳහා වඩාත් උචිත තවාන් පාත්ති ක්‍රමයකි.
1. ගිල් වූ තවාන්
2. උස් තවාන්
3. නෙරිඩෝකෝ තවාන්
4. වැලි තවාන්

20. බෝග වගාවේ දී පොහොර භාවිත කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා වැදගත්වන සාධක කිහිපයක් පහත දැක්වේ.
A – වගාවේ අවස්ථාවට සුදුසු පොහොර වර්ග තෝරා ගැනීම.
B – ප්‍රදේශයේ දේශගුණික තත්ත්වය.
C – පසේ අඩංගු පෝෂක ප්‍රමාණය.
D – සුදුසු පොහොර යෙදීමේ ක්‍රම අනුගමනය කිරීම.
මින් සත්‍ය ප්‍රකාශ වනුයේ,
1. A හා B ය.
2. B හා C ය.
3. A, B හා D ය.
4. A, B, C, D සියල්ලම

21. බෝග සංස්ථාපනයේ දී තවාන් භාවිත නොකළ යුතු බෝග කාණ්ඩය වන්නේ,
1. මාළු මිරිස්, උදු, කැරට්, මුං
2. ගෝවා, තක්කාලි, රාබු, උදු
3. උදු, වට්ටක්කා, කැරට්, රාබු
4. මාළු මිරිස්, බඩ ඉරිගු, රාබු, බණ්ඩක්කා

22. ජල සම්පාදන ක්‍රම අතුරින් පෘෂ්ඨීය ජල සම්පාදන ක්‍රමයක් නොවන්නේ,
1. පිටාර ජල සම්පාදනය.
2. ඉසින ජල සම්පාදනය.
3. බිංදම් ජල සම්පාදනය.
4. තීරු ජල සම්පාදනය.

23. බොහෝ විට තවාන් පාත්ති ජීවණුහරණය සඳහා පිළිස්සීම සිදු කරයි. මෙම ක්‍රියාවලිය සිදුකිරීමේ පියවර නිවැරදි අනුපිළිවෙල දැක්වෙන පිළිතුර වනුයේ,
1. තෙත් කිරීම, පිදුරු දැමීම, දහයියා දැමීම, පිදුරු දැමීම, දහයියා දැමීම හා පිළිස්සීම.
2. පිදුරු දැමීම, දහයියා දැමීම, පිදුරු දැමීම, තෙත් කිරීම, පිදුරු දැමීම හා පිළිස්සීම.
3. තෙත් කිරීම, දහයියා දැමීම, පිදුරු දැමීම, දහයියා දැමීම, පිදුරු දැමීම හා පිළිස්සීම.
4. දහයියා දැමීම, පිදුරු දැමීම, දහයියා දැමීම, තෙත් කිරීම, දහයියා දැමීම හා පිළිස්සීම.

24. බිම් සැකසීමේ දී භාවිතා කරන තැටි නගුල, හැඩ ලැලි නගුල, ජපන් පරිවර්ත්‍ය නගුල යන උපකරණ,
1. ද්විතියික බිම් සැකසීමට යොදාගන්නා අතර සත්ත්ව බලයෙන් ක්‍රියාකරවයි.
2. ප්‍රාථමික බිම් සැකසීමට යොදාගන්නා අතර යන්ත්‍ර බලයෙන් ක්‍රියාකරවයි.
3. අතුරුයත් ගෑම සඳහා යොදාගන්නා අතර මිනිස් බලයෙන් ක්‍රියාකරවයි.
4. ප්‍රාථමික බිම් සැකසීම සඳහා යොදා ගන්නා අතර සත්ත්ව බලයෙන් ක්‍රියාකරවයි.

25. භූමියේ මතුපිටට ආසන්නව වළලා ඇති සිදුරු සහිත නළ මාර්ගයක් ඔස්සේ බෝගයේ මූල පද්ධතියට ජලය සැපයීමේ ක්‍රමය.
1. ඉසින ජල සම්පාදනය යි.
2. වළලූ ජල සම්පාදනය යි.
3. උප පෘෂ්ඨීය ජල සම්පාදනය යි.
4. බිංදු ජල සම්පාදනය යි.

26. පහත වල්පැලෑටි අතුරින් ආක්‍රමණශීලි වල පැලෑටි පමණක් අඩංගු වරණය තෝරන්න,
1. මොණර කුඩුම්බිය හා ගඳපාන
2. බටදැල්ල හා ඇටවරා
3. තුනැස්ස හා කුඩමැට්ට
4. පාකිනියම් හා විඩේලියා

27. පරිසර හිතකාමී ගොවිතැනේ දී පළිබෝධ හානි අවම කරගැනීම සඳහා භාවිතා කල හැකි පළිබෝධ විකර්ශක ශාක වනුයේ,
1. මදුරුතලා හා කූඩලූ
2. දාස්පෙතියා හා සූරියකාන්ත
3. කූඩළු හා සූරියකාන්ත
4. කපුකිණිස්ස හා ආඩතෝඩ

28. පහත රූපසටහනේ දැක්වෙන රෝග ත්‍රිකෝණයකි.



මෙහි A අක්ෂරය මගින් පෙන්නුම් කරනුයේ,
1. ධාරකයා
2. වාහකයා
3. පරපෝෂිතයා
4. විලෝපිකයා

29. වී ශාකය පිදීමේ සිට අස්වනු මෙරීම දක්වා කාලය මෙරීමේ අවධිය ලෙස හඳුන්වයි. සෑම වී ප්‍රභේදයක් සඳහා ම මෙම කාලය දින
1. 15 කි. 2. 30 කි. 3. 45 කි. 4. 60 කි.

30. ශාක පටක හපා කෑමෙන් හානි පමුණුවන කෘමි පළිබෝධයෙකි.
1. ගොයම් මකුණා 2. සුදු මැස්සා 3. එපිලැක්නා 4. පිටි මකුණා

31. බණ්ඩක්කා වගාවක පත්‍ර නාරටි කහ පැහැයෙන් ද, නාරටි අතර කොළ පැහැයෙන්ද යුක්තව තිබූ අතර ඇතැම් පත්‍ර විකෘති වී, කුඩා වී තිබුනි. මෙයට හේතු විය හැකි රෝග කාරකයා,
1. වෛරසය කි. 2. බැක්ටීරියාව කි.
3. දිලීරය කි. 4. පිටි මකුණා

32. රතු දුඹුරු පැහැයෙන් යුක්ත ස්ඵටික ලෙස පවතින හොඳින් ජලයේ දියවන රසායනික පොහොරකි.
1. යූරියා 2. ට්‍රිපල් සුපර් පොස්පේට්
3. මියුරියේට් ඔෆ් පොටෑෂ් 4. රොක්පොස්පේට්ය.

33. කෘමීන් පාලනයට යොදාගන්නා යාන්ත්‍රික ක්‍රමයක් වන්නේ,
1. පහන් උගුල් ඇටවීම. 2. බෝග මාරුව.
3. යාය එකට වගා කිරීම. 4. උගුල් බෝග වගා කිරීම.

34. වර්තමානයේ වැසි ජලය මිනිසාගේ ගෘහස්ථ ප්‍රයෝජනය සඳහා එක් රැස්කර තබා ගැනේ. මේ සඳහා තම නිවසේ පෝෂක ප්‍රදේශය වන්නේ.
1. ගෙවත්ත ය. 2. ඉඩම් ය. 3. මිදුල ය. 4. වහලය.

- ශ්‍රී ලංකාවේ දෙමුහුම් අභිජනනයෙන් නිපදවා ඇති වී ප්‍රභේද වන BW 351 ඇසුරෙන් 35, 36 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

35. BW 351 වී ප්‍රභේදය නිෂ්පාදනය කර ඇති අභිජනන මධ්‍යස්ථානය වනුයේ,
1. බතලගොඩ 2. බෝඹුවල 3. බණ්ඩාරවෙල 4. බිදුනු වැව

36. BW 351 වී ප්‍රභේදයේ වයස මාස
1. 3 කි. 2. 4 කි. 3. 3 ½ කි. 4. 5 කි.

37. පළිබෝධ කෘමීන්ගේ ස්වභාවික සතුරෙකු ලෙස සැලකිය හැකි කෘමියෙකි
1. පස්මුළු මකුණා 2. පළඟැටියා 3. ගොඩවෙල්ලා 4. ලේඩිබර්ඩ් කුරුමිණියා

38. වී වගාවේ දී භාවිතා කරන තවාන් වර්ගයක් නොවන්නේ,
1. නෙරිඩෝකෝ තවාන 2. ඩැපොග් තවාන
3. මඩ තවාන් 4. තැටි තවාන්

39. පළිබෝධ පාලනයට යොදාගන්නා පරිසර හිතකාමී පළිබෝධ නාශකයකි.
1. පැරකොට් 2. කැප්ටාන්
3. කොහොඹ ඇටසාරය 4.මීතයිල් ඉයුජිනෝල්

40. ගොඩබිම වැඩෙන පළල් පත්‍ර වල් පැළැටිය මින් කුමක් ද?
1. කලාදුරු 2. හුළංතලා 3. දිය සියඹලා 4. කුඩමැට්ට

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade } 10 ශ්‍රේණිය

කෘෂි හා ආහාර තාක්ෂණය I -II

පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1) තෙත් කලාපයේ වෙසෙන බෝග වගාව හා සත්ත්ව පාලනයේ නියැළෙන ගොවිමහතෙක් ගොවිපළෙහි කැරට්, ලීක්ස්, ගෝවා, බෝංචි, සලාද වැනි එළවළු වර්ග වගා කිරීමටත් දේශගුණයට ගැලපෙන ගව වර්ග ඇති කිරීමටත් තීරණය කරන ලදී.

I. තෙත් කලාපයේ බහුලවම ව්‍යාප්ත වී ඇති පස් කාණ්ඩය කුමක් ද?

II. a. මෙම ප්‍රදේශයට ප්‍රධාන වශයෙන් වර්ෂාව ලැබෙන වර්ෂාපතන ආකාරය කුමක් ද?
b. එම වර්ෂාව ලැබෙන වගා කන්නය කුමක් ද?

III. පහත බෝග අයත්වන ශාක කුල සඳහන් කරන්න.
a. කැරට් b. ලීක්ස්

IV. a. ගොවිපළෙහි භාවිත කිරීමට සුදුසු තවාන් වර්ග දෙකක් සඳහන් කරන්න.
b. තවාන් මිශ්‍රණය සකසා ගැනීම සඳහා භාවිත කරන ද්‍රව්‍යය නම් කරන්න.

V. මෙම තවාන් වලට බහුලව වැළඳෙන රෝගයක් නම් කරන්න.

VI. මෙම ගොවිපළෙහි කොම්පොස්ට් සකස් කිරීමට සුදුසු යැයි ඔබ යෝජනා කරන ක්‍රම දෙකක් සඳහන් කරන්න.


VII. මෙම ගොවිමහතා බෝංචි වගා කිරීම නිසා පසට ලැබෙන ප්‍රධාන වාසිය කුමක් ද?

VIII. a. පස ආම්ලික වීමට බලපාන හේතුවක් සඳහන් කරන්න.
b.මෙම කලාපයේ පසේ ආම්ලිකතාව මග හැරීම සඳහා පසට යෙදිය හැකි ද්‍රව්‍යයක් නම් කරන්න.

IX. a.මෙම ගොවියා බෝග සංස්ථාපනයෙන් පසු පස සම්බන්ධව සිදුකරන ක්‍රියාකාරකම් හඳුන්වනු ලබන නම කුමක්ද?
b. ඒ සඳහා භාවිතා කල හැකි උපකරණ දෙකක් සඳහන් කරන්න.

X. බෝග වගාකර ඇති භූමියක පාංශු තෙතමනය ආරක්ෂා කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

2) බෝගයකින් මනා අස්වැන්නක් ලබා ගැනීමට දේශගුණික සාධක ඉතා වැදගත් වේ.



I. a. මෙම රූපයේ දැක්වෙන උපකරණයෙන් මැනගත හැක්කේ කුමන කාලගුණික පරාමිතිය ද?

b. ඉහත සාධකයෙන් බෝග වගාවට සිදුවන හිතකර බලපෑමක් හා අහිතකර බලපෑමක් සඳහන් කරන්න.

PAST PAPERS WIKI

Past Papers Wiki

II. a. මෙහි A, B, C කොටස් නම් කරන්න.
b. මෙම උපකරණය ස්ථාපනයේදී පුනිලයේ කට පිහිටිය යුත්තේ පොළව මට්ටමේ සිට කොපමණ උසකින් ද?

III. a. ශ්‍රී ලංකාවේ කෘෂි දේශගුණික කලාප කීයද?
b. කෘෂි දේශගුණික කලාප වලට බෙදීමට පදනම් වූ සාධක මොනවාද?
c. ප්‍රදේශයක උෂ්ණත්වය වෙනස් වීමට බලපාන සාධක දෙකක් සඳහන් කරන්න.

3) බෝග වර්ධනය සඳහා පාංශු සංසටක මෙන්ම පාංශු පරිසරය ද ඉතා වැදගත් වේ.

I. සම්භවය අනුව ප්‍රධාන පාෂාණ ආකාර තුන නම් කර උදාහරණය බැගින් සඳහන් කරන්න.

II. a. පාංශු භෞතික ලක්ෂණයක් වන පාංශු වයනයේ කෘෂි කාර්මික වැදගත්කම් දෙකක් සඳහන් කරන්න.
b. පාංශු වයනය නිර්ණය කිරීමට උපයෝගී කර ගන්නා ක්‍රමය නම් කරන්න.

III. a. පාංශු හායනයට හේතු දෙකක් සඳහන් කරන්න.
b. පාංශු බාදනය අවම කරන ජෛව ක්‍රම දෙකක් නම් කරන්න.

4) බෝග වගාවේදී උසස් ගුණාත්මයෙන් යුත් වැඩි අස්වැන්නක් ලබා ගැනීමට පළිබෝධ පාලනය ඉතා වැදගත් වේ.

I. බෝග වගාවේ වල් පැළෑටි මගින් සිදුවන හානි දෙකක් සඳහන් කරන්න.

II. වල් පැළෑටි රූපකාරය අනුව වර්ගීකරනය කර දක්වන්න.

III. a.කෘමීන්ගේ රූපාන්තරණයේ ප්‍රධාන ආකාර දෙක නම්කර උදාහරණය බැගින් සඳහන් කරන්න.
b.ඉන් එක් රූපාන්තරණ ආකාරයක අවධි පිළිවෙළින් සඳහන් කරන්න.

5) බෝග වගාවේදී තවානකින් ලබාගත් පැළයක් පසේ සංස්ථාපනය කිරීමටත් පසුව හොඳින් වර්ධනය වීමටත් බිම් සැකසීම මනාව සිදුකල යුතුය.

I. බිම් සැකසීමේ අරමුණු හතරක් සඳහන් කරන්න.

II. බිම් සැකසීමේ ප්‍රධාන පියවර දෙක සඳහන් කරන්න.

III. a. නෙරිඩෝකෝ තවානක් සකසන ආකාරය පියවර තුනක් ඇසුරින් පැහැදිලි කරන්න.
b. තවාන් වලදී වසුන් ලෙස භාවිතා කල හැකි ද්‍රව්‍ය දෙකක් සඳහන් කරන්න.
c. පැළ දැඩි කිරීමේදී පාලනය කරන සාධක දෙකක් සඳහන් කරන්න.

6) ලංකාවේ ප්‍රධාන වගාවක් වන වී වගාවේදී ජල සම්පාදනය ඉතා වැදගත් වේ.

I. පැරණි වී ප්‍රභේද හා නව වී ප්‍රභේද අතර වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

III. a. පාරම්පරික වී ප්‍රභේද හතරක් සඳහන් කරන්න.
b. වී වගාවේ යුෂ උරාබොන කෘමි පළිබෝධකයෙක් නම් කරන්න.

III. a. පසෙන් ජලය ඉවත්වන ප්‍රධාන ආකාර තුන නම් කරන්න.
b. ජල සම්පාදනයේ දී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් සඳහන් කරන්න.
c. ජල වහන කාණු රටා දෙකක් නම් කරන්න.

7) බෝග වගාවේදී පෝෂණ ඌනතා මග හරවා ගැනීම සඳහා පොහොර යෙදීම සිදුවේ.

I. a. කෘෂිකර්මාන්තයේ දී භාවිතවන කාබනික පොහොර වර්ග හතරක් සඳහන් කරන්න.
b. කාබනික පොහොර යෙදීමෙන් ඇතිවන වාසි දෙකක් සඳහන් කරන්න.

II. වෙළඳපොළෙහි ඇති පූර්ණ පොහොර හා අර්ධ පොහොර අතර ඇති වෙනස සඳහන් කරන්න.

III. a. පොහොර පසට යොදන ආකාර දෙක සඳහන් කරන්න.
b. රසායනික පළිබෝධනාශක භාවිතයේ දී අනුගමනය කල යුතු පිළිවෙත් තුනක් සඳහන් කරන්න.

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library